# හිටපු අමාත්‍ය ජී. එල්. පීරිස් දැක්වූ අදහස්

සියලු දෙනාටම සුභ උදෑසනක්. මේ මාධ්‍ය සාකච්ඡාවට අප සමඟ එකතු වෙනවා, එක්සත් ජනරජ පෙරමුණේ නායක පාඨලී චම්පික රණවක මැතිතුමා. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් දොස්තර රාජිත සේනාරත්න මැතිතුමා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම් දුමින්ද දිසානායක මැතිතුමා. හා සවර්ජන බලය නියෝජනය කරමින් ගෝබී ලෝගනාදන් මැතිතුමා. එතුමා සභාපති, සවර්ජන වතු සේවක සංගමය.

දැන් ඉන්ධන මිල හත්වෙනි වතාවටත් වැඩි කරලා තියෙනවා. මේ ගතවෙච්ච මාස පහ ඇතුළත හත්වෙනි වතාව. මේ සැරේ සෑහෙන ප්‍රමාණයකින්. පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සියල්ලම. එතනින් නවතින්නෙ නෑ. ආයෙත් මිල වැඩි වෙනවා. ලයිට් බිලත් වැඩි වෙනවා.

මේවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පනවලා තිබෙන අනිවාර්ය කොන්දේසි. මේවට යටත් වෙලා තමයි ගිය සතියේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකා රජයට යූ.එස්. ඩොලර් මිලියන 695ක් ලබා දුන්නේ. නිකන් නෙමෙයි. මේ කොන්දේසි වලට ශ්‍රී ලංකා රජය අවනත කරගනිමින්.

දැන් අනිත් රටවල් කොහොමද හැසිරිලා තියෙන්නේ? ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල පහළ වැටෙනවා. පාකිස්ථානය ඒ සහනය ජනතාවට දීලා තියෙනවා. තෙල් මිල රුපියල් 22 න් අඩු කරලා තියෙනවා පාකිස්ථානයේ. ජනතාවට ලෙන්ගතුකමක් ඇතිව. ජනතාව දරන පීඩනය පිළිබඳ යථාථර්වාදී හැඟීමක් ඇතිව, ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල අඩු වෙනකොට ඒකෙ සහනය පාකිස්ථානයේ ජනතාවට ලබාදීමට ඒ රටේ ආණ්ඩුව කටයුතු කරලා තියෙනවා.

අපේ රටේ ඒක සම්පූණර්යෙන්ම අනිත් පැත්ත. ශ්‍රී ලංකා රජය එකඟ වෙලා තියෙනවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සැප්තැම්බර් මාසයට ඉස්සෙල්ලා සියලුම සහනාධාර මේ සම්බන්ධයෙන් ඉවත් කිරීමට. එතකොට ඒකෙ ප්‍රතිඵලය වෙන්නේ, මේ රටේ ජීවන වියදම දරාගන්න බැරි තත්ත්වයකට පත්වීම.

දැන් මේ මැදපෙරදිග යුද්ධයෙන් බැටකාපු එකම රට ලංකාව නෙවෙයි. ඒක පොදු ප්‍රශ්නයක්. හැබැයි අනිත් රටවල් වල පාලකයන් ඒ රටේ ජනතාව සමඟ අවංක සංවාදයක යෙදිලා තිබෙනවා. මෙන්න මේක තමයි ප්‍රශ්නය. සාමූහිකව අපි මොනවාද ගන්න ක්‍රියාමාගර් හානිය අවම කර ගැනීමට? විවෘත සාකච්ඡා, ජනතාව විශ්වාස කරලා, ආණ්ඩුවයි ජනතාවයි සියල්ලෝම එකතු වෙලා, කිසිවක් හංගන්නේ නැතුව, සම්පූණර් විනිවිදභාවයෙන් යුක්තව මේ ගැටලුවට සාමූහික විසඳුමක් සොයා ගැනීම සඳහා අවංක උත්සාහයක යෙදෙනවා ඒ රටවල් වල ආණ්ඩු.

ජපානයේ අගමැතිනිය හැමදාම ඒ රටේ ව්‍යාපාරික ප්‍රජාව සමඟ කතා කරනවා. ස්වේච්ඡාවෙන් අපිට ගන්න පුළුවන් පියවර මොනවාද කියන එක සම්බන්ධයෙන්. සිංගප්පූරු රජයේ ජ්‍යෙෂ්ඨතම ඇමතිවරුන් හැමදවසේම ඒගොල්ලන්ගේ කාලයෙන් වැඩි කොටසක් ගත කරන්නේ ඒ විදියේ සාකච්ඡාවක් සිංගප්පූරුවේ ජනතාව සමඟ යෙදීමට. කොහොමද මේකට මුහුණ දෙන්නේ? අපි මොනවාද කරන්නේ?

ඉන්දියාවේ නරේන්ද්‍ර මෝදි අගමැතිතුමා ප්‍රායෝගික පියවර 4 ක් ඉන්දියාවේ ජනතාවට යෝජනා කරලා තියෙනවා. මෙන්න මේ මේ විදිහට අපේ කටයුතු කලොත් මේ ප්‍රශ්නයෙන් ගොඩක් දුරට අපිට ගොඩ එන්න පුළුවන් වෙයි කියලා.

ඕස්ට්‍රේලියාවේ ප්‍රාන්ත 3 ක් මේ ප්‍රශ්නයේ බැරෑරුම් භාවය අවබෝධ කරගෙන සීමිත කාලයකට ඔස්ට්‍රේලියාවේ ජනතාවට අවකාශ සපයා දීලා තියෙනවා දුම්රිය හා බස් වල නොමිලේ ගමන් කිරීමට. ඒ ප්‍රමාණයට ප්‍රතිචාර දක්වලා තිබෙනවා ඒ රටවල් වල ආණ්ඩු. අවංකකම, විවෘතභාවය, ජනතාව විශ්වාස කිරීම. අපේ රටේ ආණ්ඩුව ඊට හාත්පසින් වෙනස් ප්‍රතිපත්තියක් අනුගමනය කරලා තියෙනවා. ජනතාව රැවටීම, ජනතාවට බොරු කීම.

දැන් මහා භාණ්ඩාගාරයෙන් එක වතාවක් නෙවෙයි, අවස්ථා දහයකදී හොර ගිණුමකට මේ රටේ ජනතාවගේ මුදල් යැව්වා. ඊට පස්සේ කියනවා මේක ගැටලුවක් නෙවෙයි. මේ ගැන කරදර වෙන්න අවශ්‍ය නෑ, මේ මුදල් ආපහු අපි ලබා ගන්නවා. ආණ්ඩුව හොඳ හැටි දන්නවා සතයක්වත් ආපහු ලැබෙන්නේ නෑ කියලා. ඒ සල්ලි ගියා ගියාමයි.

ඉතින් ප්‍රශ්නයට මුහුණ දෙන්නේ නෑ. මඟ හරිනවා. සත්‍යය වසන් කිරීමට උත්සාහ කරනවා. එවැනි ප්‍රතිපත්තියකින් කිසිම ප්‍රශ්නයකට විසඳුමක් ලැබෙන්නේ නෑ.

දැන් මේ ආර්ථික අබර්ුදයට එකම හේතුව මැදපෙරදිග යුද්ධ තත්ත්වය නෙවෙයි. අපේ රටේ ජනතාවගේ මුදල් වලින් මහා පරිමාණයේ මගඩි, වංචා, නොසැලකිල්ල නිසා අදහාගන්න බැරි ප්‍රමාණයක ධනස්කන්ධයක් කාබාසිනියා කෙරිලා තියෙනවා.

ගල්අඟුරු වංචාවෙන් අපේ රටට ඇතිවෙච්ච අලාභය දළ වශයෙන් රුපියල් ලක්ෂ විසි දෙදහසක්. ඒකෙන් පමණක්, ගල්අඟුරු වංචාවෙන් විතරක්.

ගුණාත්මක භාවයෙන් අඩු ගල්අඟුරු මෙහේට ගෙනාවා. එතකොට විදුලි බලය නිෂ්පාදනය සම්බන්ධයෙන් උග්‍ර ප්‍රශ්නයක් ඇතිවුණා. ඒක පියවගන්න ඩීසල් ඉතාමත් අධික මිලකට ලබාගන්න සිදු වුණා ගල්අඟුරු මගඩිය නිසා. ලෝකයේ විශාලතම මුදල ඩීසල් සඳහා ගෙව්වේ ලංකාව. බැරලයකට ලංකාව ගෙව්වා ඩොලර් 286ක්. මේ මගඩිය වසාගන්න. ලෝක වෙළඳපොලේ තිබ්බ්ච මිල තමයි බැරලයකට යූ.එස්. ඩොලර් 130යි 155යි අතර.

මහා භාණ්ඩාගාරයේ කිසිම සැලකිල්ලක් නැතුව, හොර ගිණුමකට, දිගින් දිගටම සල්ලි යැවීම නිසා ඇතිවෙච්ච පාඩුව රුපියල් ලක්ෂ අටදහස් අටසියයක්. අස්වැසුම අක්‍රමිකතා නිසා අලාභය ලක්ෂ රුපියල් දෙදහස් හාරසිය අසූවක්. ජාතික සංවධර්න බැංකුවේ මගඩිය නිසා රුපියල් ලක්ෂ එක්ලක්ෂ හතලිස්දාහක්. තැපැල් කාර්යාලයේ මගඩිය නිසා රුපියල් ලක්ෂ දෙදහක් ද දෙසියක් දළ වශයෙන්. ඒ ඇරෙන්න රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකන් එයාලර්යින්ස්, මේවා ඔක්කොම එක්කාසු කරාම බලන්න අපේ රටේ ජනතාවගේ මුදල් කෙතරම් ප්‍රමාණයක් කාබාසිනියා වුනාද කියලා.

මේකෙන් සුලු ප්‍රමාණයක් ඉතිරි කරගන්න පුලුවන් වුනා නම්, මේ ප්‍රමාණයට අපේ ජනතාව ආර්ථික පීඩනයකට ලක් කිරීමට සිදු වන්නේ නෑ. මේ විදිහට අවශ්‍ය ආහාර භාණ්ඩවල මිල ආකාසයට උඩින් යන්නේ නෑ. මේ විදිහට බදු ගහලා ජනතාව අසමාන්‍ය පීඩනයකට ලක් කිරීමට අවස්ථාවක් එන්නේ නෑ මේ විදිහේ මහා පරිමාණයේ සොරකම් නොකෙරුණා නම්.

මේවා ආණ්ඩුව ගන්නේ බොහොම සැහැල්ලුවෙන්, මේවා ප්‍රශ්න නෙවෙයි. හැබැයි, මෙන්න මේවා තමයි හේතු, යුද්ධයකුත් තියෙනවා ඒක ඇත්තයි. හැබැයි යුද්ධය පමනක් නෙමෙයි මෙන්න මේ විදිහට

ජනතාවගේ මුදල් මහ දවල් කොල්ල කෑමක් නිසා තමයි මේ විදිහේ අද්විතීය ආර්ථික අබර්ද්දයකට අපේ රට පත් වෙලා තියෙන්නේ.

එතකොට බලන්න මොනවාද මේ ආණ්ඩුව කරන්නේ, කිසිම අරපරිස්සමක් නැතුව බලන්න ජනතාවගේ මුදල් කොච්චර නාස්ති කළාද කියලා.

මෑතකදී මේ රටට ගෙන්නුවා ලෝකයේ ඉස්තරම්ම ගණයේ විශාලතම වටිනාකම ඇති මෝටර් රථ වාහන. මුළු ලෝකයටම නිෂ්පාදනය කරන්නේ මේ විදිහේ වාහන 25යි. මුළු ලෝකයටම 25යි. ඒ කාටවත් ඒවා ගන්න පුලුවන් වාහන නෙමෙයි. කවුද මේ වාහන ගන්නේ? බ්‍රිතාන්‍යයේ රජ පවුල, මැදපෙරදිග ඛනිජ සම්පත්, ඉන්ධන, ගෑස් මේ සියල්ලක්ම අනන්ත අප්‍රමාණව තියෙන සවුදි අරාබියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය මේ වගේ රටවල්වල ශීක් පාලකයන්.

තෙල් වලට කියන්නේ කළු රත්තරන්, ඩොලර් පිරී ඉතිරී ගිය රටවල්. ඇමරිකානු එක්සත් ජනපදයේ ධනේශ්වරම පන්තියේ කෝටිපතීන් අතර කෝටිපතීන්. මෙන්න මේ අයට පමණයි ගන්න පුලුවන් වන්නේ, මේ වාහන මුළු ලෝකයටම 25යි. ඒවා ලංකාවට ගෙන්නුවා. හෙලිකොප්ටර් ගෙන්නුවා. ඒ හෙලිකොප්ටර් මිලදී ගන්නවා ලංකාවේ ව්‍යාපාරිකයන්. පත්තර වල පින්තූර වැටෙනවා. දවසට වේල් දෙකක් කන්න බැරි මිනිස්සු මේ පින්තූර දකිනවා.

දැන් මේ කෝටිපතියන්ට රුපියල් හිඟයක් නෑ, බිලියන ගණන් රුපියල් තියෙනවා. හැබැයි ආණ්ඩුව මොකක්ද කරේ, ඒ රුපියල් ඩොලර් වලට හැරවීමට අවසර දුන්නා. දැන් ඒ ඩොලර් තමයි අවශ්‍ය වන්නේ අපේ රටේ ජනතාවට අත්‍යවශ්‍ය ආහාර පානාදිය, එදිනෙදා ජීවිතය කරගෙන යෑමට උවමනා දේවල් ලබා ගැනීමට තමයි ඒ ඩොලර් අවශ්‍ය වන්නේ.

එතකොට ඒ ජනතාවගේ අවම අනිවාර්ය දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට තියෙන ඩොලර් තමයි මේ කෝටිපතීන්ගේ අවශ්‍යතා සපුරා ලීමට මේ රජය ලබා දෙන්නේ.

එතකොට මොකක්ද මේ ආණ්ඩුවේ ප්‍රමුඛත්වය? කෝටිපතියන්ගේ සුඛ විහරණයද? එහෙම නැත්නම් ජනතාවගේ අවශ්‍යතාව? හාල්, සීනි, පිටි, මේවා ලබා ගැනීමට අවශ්‍ය ඩොලර් නේද මේ මහා විනාශයක් කරන්නේ, මේ හෙලිකොප්ටර් සුඛෝපභෝගී වාහන, බ්‍රිතාන්‍ය රජ පවුල පාවිච්චි කරන වාහන ලබා ගැනීම සඳහා. අපේ ජනතාවට අත්‍යවශ්‍ය ඩොලර් ලබා දීමට මේ රජය කටයුතු කරන්නේ කිසිම විදියේ වගකීමක් ඇතිවද? හිතක් පපුවක් ඇතිවද? මොකක්ද මේකේ සාධාරණත්වය? මොකක්ද මේකේ සානුකම්පිත භාවය? මේක ආණ්ඩුවක්ද? දැන් ඉස්සෙල්ලා කිව්වනේ එහෙනම් ආණ්ඩුවක් මොනවාටද අවශ්‍ය? ඇත්ත වශයෙන්ම ආණ්ඩුවක් නොතිබුණා නම් මීට වඩා තත්ත්වය හොඳ නැද්ද? කියන ප්‍රශ්නය කාටත් සිද්ධ වෙනවා.

එතකොට බලන්න දැන් මේ විදිහේ තත්ත්වයක් තුළවත් හොරකම් නවත්වලා, ඉතාමත් අමාරුවෙන් හුස්ම ගන්න අවස්ථාවකදී, ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටෙන අවස්ථාවකදී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා ආර්ථික සංවර්ධන වේගය 3%කට බහිනවා කියලා. එවන් තත්ත්වයක් තුළ පවා සල්ලි හොරකම් කිරීමේ පිපාසය කිසිසේත් සංසිඳුවා ගන්න පුළුවන් වෙලා නෑ. ඒ විදිහටම හොරකම් කෙරෙනවා.

දැන් ආණ්ඩුව 50%ක අධිබාරයක් පැනෙව්වා, වාහන ආනයනය කිරීම සම්බන්ධව. හැබැයි ඊට දවස් දෙක තුනකට ඉස්සෙල්ලා බැංකු ණයවර ලිපි අසාමාන්‍ය ප්‍රමාණයකට නිකුත් කරලා. ඊට ඉස්සෙල්ලා සතිය සමහ

සංසන්දනය කරනකොට පැහැදිලි වෙනසක් තියෙනවා, පරතරයක්. එතකොට සාධාරණ සැකයක් ඇති වෙනවා රජයට ඉතාමත් සමීප ව්‍යාපාරිකයන්ට ඇතුළෙන් ලැබිච්ච තොරතුරු පාවිච්චි කරලා කෝටි ගණන් හෙච්චායි කියලා මේ විදිහේ අසාමාන්‍ය ආර්ථික අබර්‍දයක් තුළ. සාමාන්‍ය ජනතාවගේ දුක පීඩනය ඒගොල්ලන්ට ප්‍රශ්නයක් නෙමෙයි, මේ අවස්ථාව තව තව සල්ලි හොයන්න.

එතකොට මේ තත්ත්වය ගැන අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු වුණා. එම නිසා දැන්වත් ජනතාව පිළිබඳ යම්කිසි හැඟීමක් ඇතිව, මේ වංචා මගඩි නැවැත්වීමට රජය කිසිම උත්සාහයක් කරන්නේ නෑ, තමන්ට හිතවත් අයට තව තව සල්ලි හොයන්න අවකාශ සපයා දීම තමයි රජයේ ප්‍රතිපත්තිය වෙලා තියෙන්නේ.

දැන් අපි ඉතාමත් පැහැදිලිව කියනවා මේ තත්ත්වය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනිවාර්ය යුතුකමක් තියෙනවා. දැන් මේ ගිය සතියේ දුන්න යූ.එස්. ඩොලර් මිලියන 695, මේවා පරිත්‍යාග නෙමෙයි, මේවා ණය. මේවා ආපහු ගෙවන්න මේ රටේ ජනතාවට සිදු වෙනවා. ආණ්ඩුවට නෙමෙයි ණය ගෙවන්නේ, මේ රටේ ජනතාවට. මේවා ආපහු අය කරගන්නවා පොලී සහිතව. ජනතාවගේ පොකට් එකෙන් ඒවා ගෙවන්න සිදු වෙන්නේ.

ඉතින් එහෙනම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පැහැදිලි යුතුකමක් තියෙනවා වගබලා ගන්න, මේ මුදල් නිසි අරමුණු වලට යොදවනවාද කියලා. එක එක්කෙනාගේ සාක්කු වලට යන්න නෙමෙයි, නොයෙක් මගඩි වලට නෙමෙයි. එතකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ මුදල් අපිට ලබා දෙනවා නම් ණයක් හැටියට, ඒවා ආපහු ගෙවන්න ඕනේ නිසා, ඒ අයට ඒ වගකීමෙන් මිදෙන්න බෑ. අහක බලාගෙන අපි සල්ලි දුන්නා, අපි බැංකුවක්. IMF කියන්නේ මොකක්ද? IMF කියන්නේ බැංකුවක්. අපේ රටේ ජනතාවගේ සුභසිද්ධියට ඇප කැප වෙලා තියෙන පුණ්‍යායතනයක් නෙමෙයි, ඒක බැංකුවක්. එතකොට ඒ බැංකුවට එහෙම ආකල්පයක් ගන්න බෑ "අපි අපි සල්ලි ණයට දෙනවා, ඊට පස්සේ පොලියත් එක්ක ඒ ණය ආපහු අපි ලබා ගන්නවා, එච්චරයි. අපේ කාර්යභාරය, කතර්ව්‍යය එතනින් අවසානයි" කියලා. එහෙම අදහසක් අපි කිසිසේත් පිළිගන්නේ නෑ. ඒක අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. මේ මුදල් ලබා දෙනවා නම්, ඒ මුදල් ආපසු අය කරගන්නවා නම්, එහෙනම් ඒ අය වග බලා ගන්න ඕන මේ මුදල් මේ රටේ සංවධර්නයට, ජනතාවගේ ශුභ සාධනයට යොදවනවාද කියලා. එහෙනම් ඒ වගකීමෙන් කිසිසේත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මිදෙන්න බැරි බව අපි බොහොම පැහැදිලිව සඳහන් කරනවා."

## හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක දැක්වූ අදහස්.

"පිඟන් හෝදලා අත් කහවෙච්ච අපේ සහෝදරියන්ගේ අත්වලින් අමාරුවෙන් මේ රටට එන ඩොලර් තමයි අද සරත් රෙඩ්ඩි හරහා ගල් අඟුරුවලින් හොරකම් කරන්නේ. ඒ වගේම ට්‍රැෆිගියුරා හා ආදිත්‍ය බීලර්‍ා හරහා තෙල්වලින් ගනුදෙණු කරන්නේ.

අපි අල්ලස් කොමිසමට පැමිණිල්ලක් කළා පසුගිය දවස්වල. ට්‍රැෆිගියුරා ආයතනයෙන් ඩීසල් මිලදී ගැනීමක් පිළිබඳව. ඒකේ සාමාන්‍ය ප්‍රිමියම් එක රුපියල් 8 යි ලීටරයකට. මේ ට්‍රැෆිගියුරා එකට ගෙව්වා අනුර කුමාර දිසානායක රුපියල් අනූ අටක්. ඒ අනුව පැලවත්ත ඇඩඩ් ටැක්ස් (Added tax) එක ඩීසල් ලීටරයකට රුපියල් 90 යි. ඒක කියන්න ඕනේ. රුපියල් 90 යි! මේක ඉතාම පැහැදිලිව අපි ඉදිරිපත් කළාට පස්සේ මේ ඒකාබද්ධ විපක්ෂයේ නායකයෝ, ට්‍රැෆිගියුරා එක තමන්ගේ ගාස්තුව නැවත අඩු කළා රුපියල් 8 ට.

ඊළඟට ආදිත්‍ය බීලර්‍ාගෙන් ගත්තා රුපියල් 118 ට. පැලවත්ත ඇඩඩ් ටැක්ස් එක එතන රුපියල් 110 යි ලීටරයකට. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති කිව්වා රුපියල් 750ක් වෙනවා ඩීසල් ලීටරයක් කියලා.

ජනාධිපතිතුමා කිව්වා 720ක් කියලා. පුළුවන්නම් මම අභියෝග කරනවා ඒ 720 හැදිච්ච හැටි අපිට කියන්න කියලා. මොකද, අපි පෙන්නන්නම් දැන් මොකක්ද තත්ත්වය කියලා ඩීසල් වල.

මේ තියෙන්නේ ඩීසල්වල පසුගිය යුද්ධයේ අවස්ථාවේ ඉඳන් මේ දක්වා අගය වෙනස් වෙච්ච හැටි. අපි ගණන් හදන්නේ සිංගප්පූර් ප්ලැට්ස් (Singapore Platts) වලට. අර ජනතා විමුක්ති පෙරමුණේ මාධ්‍ය මඩකරියන්ට කියන්න ඕනේ, මම සිංගප්පූර් ප්ලැට්ස් කිව්වහම ඒගොල්ලෝ වෙබ් එකට ගිහිල්ලා සිංගප්පූරුවේ ඩීසල් මිල හොයලා, පායලී කියන්නේ පව කියලා ලියලා දුන්නා. සිංගප්පූර් ප්ලැට්ස් කියන්නේ ඉන්ඩෙක්ස් (Index) එක. මෙන්න ඉන්ඩෙක්ස් එක වැඩි වෙලා තියෙන හැටි. දැන් බලන්න මේ ඉන්ඩෙක්ස් එක අඩු වේගෙන යනවා. මෙතෙන්දි කීයද ලංකාවේ ඩීසල්? රුපියල් 281යි. මෙතෙන්දි කීයද අනුර කුමාරගේ ඩීසල්? 403යි.

එහෙනම් මේ ලෝක වෙළඳපොළේ ප්‍රශ්නයක් හින්දා නෙවෙයි ඩීසල් මිල වැඩි වෙන්නේ. ඊළඟට ගන්න පෙට්‍රල්. මෙතෙන්දි තිබ්බ්ච ගාන නෙවෙයි මෙතෙන්දි තියෙන්නේ. දැන් මේ ක්‍රමයෙන් පෙට්‍රල් මිල අඩු වේගෙන යනවා සිංගප්පූර් ප්ලැට්ස්. හරි? අපි කියන්න ඕනේ ඔය යුද්ධ ගැන කියනවා නම්, ගෝඨාභය මහත්තයාගේ කාලේ යුක්‍රේන ආක්‍රමණය සිදුවෙච්ච වෙලාවේ, 2022 මාතර්‍් මාසේ බ්‍රෙන්ට් කෲඩ් ඔයිල් (Brent crude oil) එක බැරලය ඩොලර් 139ට ගියා. අද මේ සියලු මාධ්‍යවේදීන්ට අපි කියනවා ගිහින් බලන්න, අද ඩොලර් 93යි.

ඊළඟට, මේ අපි හැමෝම ඒ ආණ්ඩුවල හිටියා, මහින්ද රාජපක්ෂ මහත්මයා යුද්ධය කරගෙන යනකොට 2008දී ලෝක ආර්ථික අබර්ුදයක් හටගත්තා. බැරලය ඩොලර් 147ට ගියා. ඒ අස්සේ රටේ මහා දැවැන්ත යුද්ධයක් තිබුණා එල්.ටී.ටී.ඊ. එකත් එක්ක. එහෙම තිබිලත් ඒ ප්‍රශ්න ආවේ නැහැ. දැන් මේ හැම ප්‍රශ්නෙම මේ ගල්ෆ් ඔයිල් (Gulf oil) එක මත දාලා හරියන්නේ නැහැ. අපි බොහොම පැහැදිලිව කියනවා මේ කාරණා ඇතිවෙලා තියෙන්නේ ජාවාරමක් ගෙනියනවා ඩීසල්, පෙට්‍රල්වල, වගේම ගල් අඟුරුවලත්. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේක වෙන්නේ.

ඒ වගේම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉඩ දීලා තියෙන්නේ රුපියල් බිලියන 57යි තෙල් සහනාධාරය දෙන්න. ඒ 57 බොහෝ දුරට මේ ජූනි මාසේ ඉවර වෙනවා. එතකොට ලබන මාසේ වෙනකොට නැවත වැඩි කරන්න වෙනවා. අන්න එතකොට තමයි මැදපෙරදිග වැඩ කරන සහෝදර, සහෝදරියන්ගේ, ඒ වගේම කොරියාවේ වැඩ කරන දරුවන්ගේ අත්වල කරගැට මතක් වෙන්නේ අපේ ජනාධිපතිතුමාට. එහෙම තමයි අමාරුවෙන් ඩොලර් උත්පාදනය කරලා තියෙන්නේ. 'අපට අයිතියක් නැහැ දෙයියනේ මේවා පුච්චන්න' කියලා මතක් වෙන්නේ. ඊට කලින් පැලවත්තෙන් වංචාව, දූෂණය හරහා මේ ඩොලර් ටික කොල්ල කනකොට ඒ කිසි අනුකම්පාවක් තිබුණේ නැහැ.

ඉතින් ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා, ජනාධිපතිතුමා යවලා තියෙනවා ලිපියක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට 'මම මේවා වැඩි කරනවා' කියලා. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටත් බොහොම පැහැදිලිව කියනවා, ඒගොල්ලන්ගේ කොන්දේසිවල යහපාලන කොන්දේසි, දූෂණ විරෝධී කොන්දේසි තිබුණා. ඒවා පිළිබඳ සොයා බැලීමකින් තොරව මේ ආණ්ඩුවේ මේ ක්‍රියාවලිය ඉදිරියට ගෙනියන්න ඉඩදීම ගැන අපේ විරෝධය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටත් ලබා දෙනවා.

ඒ වගේම මහාචාර්ය ජී. එල්. පීරිස් මමතා කිව්වා වගේ මතක තියාගන්න, ඩොලර් මිලියන 695ක් ලැබුණා, පොලිය 8% යි හොඳේ! පොලිය 8% යි!. ඉතාම අධික පොලියට ලැබිච්ච ණයක්. හරි? ඒක මේ නිකන් සැහැල්ලු, සරල දශම එකේ ජයිකා (JICA) පොලියක් නෙවෙයි. 8% ට වැඩි මිසක් අඩු නැහැ.

ඒ වගේම කියන්න ඕනේ, මතයක් පැතිරිලා යනවා දැන් මේ රටේ හොරකම් කරන්නේ නැහැ නේද කියලා? මාලිමාවේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීලා හොරකම් කරන්නේ නැහැ නේද? සභාපතිලා හොරකම් කරන්නේ නැහැ නේද? මන්ත්‍රීලා හොරකම් කරන්නේ නැහැ නේද? ආදි වශයෙන්. සමහරවිට ඒවා ඇත්ත වෙන්න ඇති, දැන් ඔය කැල්ල විතරයි සිරස දාන්නේ.

නමුත්, බොහොම පැහැදිලිව කියන්න ඕනේ අර පුත්තලමේ මන්ත්‍රීතුමෙක්ගේ දුවෙක් කිව්වා 'තාත්තා කොළ පාට ක්‍රෙඩිට් කාඩ් (Credit card) එකෙන් වැය කරනවා' කියලා. දැන් මේ අපේ වෛද්‍ය රාජිත සේනාරත්න මහත්තයා එහෙම දන්නවා, බොල්ෂෙවික් පක්ෂවල තියෙනවා 'මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදය' කියලා එකක්. ඒ මධ්‍යගතව තමයි වැඩේ කෙරෙන්නේ. දැන් මේ රටේ ඉතිහාසයේ හොරකමත් මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදීව තමයි වෙන්නේ. පැලවත්තෙන් ගහනවා, ක්‍රෙඩිට් කාඩ්වලින් බෙදනවා, රටට පේන්නේ නැහැ. ඒක තමයි අද මේ රටේ වංචාව, දූෂණය මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදයට අනුව ගෙනියන බවට තිබෙන නිදසුන.

ඒ වගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාතර්ාව නිකුත් වුණා ලංකාව සම්බන්ධයෙන්. කෙටියෙන්ම කිව්වොත් වධර්න වේගය 5% සිට 3% ට අඩු වෙලා තියෙනවා. මම ඉස්සරහට පෙන්නන්නම් ඒක 3% වෙන්නෙත් නැහැ මේ වසරේදී. ඊළඟට උද්ධමනය, සෘණ දශම පහේ (-0.5%) සිට පහ (5%) ඉක්මවා ගිය ප්‍රමාණයකට වැඩි වෙලා තියෙනවා. ඒ වගේම ජාතික ඉතුරුම්, මේ නැෂනල් සේවිංග්ස් (National savings) ආණ්ඩුවේ සේවිංග්ස් එක සෘණ දශම හතරයි (-0.4%). ඊට කලින් අවුරුද්දේ ඒක ධන දශම හතයි (+0.7%). ඒකේ තේරුම මොකක්ද? ආණ්ඩුවේ ආදායම්වලින් ආණ්ඩුවේ පුනරාවතර්න වියදම් අඩු කළාහම මේ කාලේ, කෙටි කාලය තුළදී දැන් ඒක නැවත සෘණ වෙලා තියෙනවා. ඒකයි මේ රට පල්ලම් බහිනවා කියලා අපි කියන්නේ. ඊළඟට ගෙවුම් ශේෂය, එහෙමත් නැත්නම් කරන්ට් එකවුන්ට් ඩෙෆිසිට් (Current account deficit) එක. ඒ කියන්නේ අපේ විදේශ වත්කම් වෙළඳාම, පෙර අවුරුද්දේ (ධන) +1709යි, මේ අවුරුද්දේ (සෘණ) -534යි. ඒකත් සෘණ.

එතකොට බාහිර විදේශ ණය ප්‍රමාණය ආසන්නයෙන් ඩොලර් බිලියන දෙකකින් නැගලා තියෙනවා. ආයෝජන, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව 2% න් අඩු වෙලා තියෙනවා. ඊළඟට ආණ්ඩුවේ ආයෝජන කියලා පෙන්නලා තියෙනවා මේ, විහිළු ඉලක්කමක්. 5.8% ක් දළ දේශීය නිෂ්පාදනය, ට්‍රිලියන දෙකක් කියලා. ඒ ට්‍රිලියන දෙක කොහොමද හැදිලා තියෙන්නේ? ආණ්ඩුවේ අයවැය ඉදිරිපත් කරපු අනුර කුමාර දිසානායක මහත්මයා කිව්වා 1500ක් බිලියන තියෙනවා ප්‍රාග්ධන වියදම් ආණ්ඩුවේ, දිට්වා සුළි කුණාටුවෙන් ගොඩවීම සඳහා තව බිලියන 500ක් දානවා කියලා කිව්වා නේ? හරි? එතකොට 2000 යි.

මේ ජූනි පළවෙනිදා, මේ ගම්වල, මේ රටේ කොහේවත් කෙරිච්ච සංවධර්නයක් තියෙනවද? ආණ්ඩුවේ ආයෝජනයක් තියෙනවද? ආණ්ඩුවේ ආයෝජනයක් නැති වුණාහම මොකද වෙන්නේ? අර බලාපොරොත්තු වෙන වධර්න වේගය නැවත ලැබෙන්නේ නැහැ. ඒක මම බොහොම පැහැදිලිව කියනවා ඔය 3% ත් ලැබෙන්නේ නැහැ මොකද ආණ්ඩුවේ ආයෝජන සිද්ධ වෙන්නේ නැහැ.

දැන් මේ ආණ්ඩුව කරන්නේ හරිම සරල දෙයක්. මේ ජනාධිපති ඇතුළු මේ ආණ්ඩුවට තමන්ට වැඩක් කරගැනීමේ හැකියාවකුත් නැහැ රාජ්‍ය පරිපාලනය පිළිබඳ, බුද්ධිමය භාවයකුත් නැහැ, තියෙන්නේ උද්ධච්චකම විතරයි. සමාජ මාධ්‍යවල යම් යම් දැ වැපිරූ පමණින්, කොමෙන්ට් (Comment) දාපු පමණින් ඒ බලකා මෙහෙයවපුවහම 'අපි ගොඩ' කියලා හිතන සිතුවිල්ලක් ඇතිවෙලා තියෙනවා. දැන් ඒක බිඳ වැටෙමින් තියෙන චිත්‍රය ඕස්ට්‍රේලියාවේ අපේ විදේශ ඇමතිතුමාගේ හිස්වෙච්ච පුටුවලින් අපි දැක්කා. ඒ විදේශ රටවල තිබ්බ ඒ බැලුම, ඒ පුම්බපු මාලිමාව දැන් හුලං බහිමින් තියෙන බව හොඳට පේනවා. ඒක මේ රට ඇතුලෙත් එහෙමම වෙමින් තියෙනවා.

දැන් මොනවාද වෙන්නේ? ගිය අවුරුද්දේ මොකක්ද තත්ත්වය? ගිය අවුරුද්දේ පුදුම ආඩම්බරයක් තිබුණා. කස්ටම් (Custom) එකේ ආදායම් පිරිලා, ට්‍රිලියන ගණන් එනවා, ඉතිහාසයේ ප්‍රථම වතාවට පිරිසිදු ආණ්ඩුවක් ඇවිල්ලා ආදායම් වැඩි කරගත්තා කියලා එහෙම කිව්වා නේ? කොහෙන්ද ඒවා ආවේ? වාහනවලින්. ඩොලර් බිලියන 2.8 ක වාහන ගෙන්නුවා, රුපියල් බිලියන 900 ට වැඩි ප්‍රමාණයක් බදු අය කරගත්තා කස්ටම් එකේ ආදායම වැඩි වුණා. දැන් ඊට පස්සේ මොකද වුණේ? මේ වාහන ගෙන්වීම නිසා ලක්ෂ තුනකට ආසන්න, මොකද වෙලා තියෙන්නේ? දෛනික ඩීසල්, පෙට්‍රල් භාවිතය වැඩිවෙලා තියෙනවා අඩුම ගානේ ටොන් 1000 කින්. එහෙනම් ලීටර් දොළොස් ලක්ෂයකින් (1,200,000). දැන් ඊළඟට මොකද කියන්නේ? වාහන ගෙන්නුවා,

අපේ මහාචාර්යතුමා කිව්වා වගේ රෝල්ස් රොයිස් (Rolls-Royce) වල ඉඳන් වාහන, ගෙන්වන්න ඉඩ දුන්නා. දීලා මොකද වුණේ? දැන් කියනවා ඩොලර් නැහැ කියලා. "ආ වහාම වාහනවලට පනවන්න බාධක". දැන් ඊළඟට මොකද වෙන්නේ? කස්ටම් (Custom) එක තව මාසෙකින් විතර ඇවිල්ලා කියනවා 'සර්, ආදායම බැහැලා' කියලා. ඊළඟට මොකද කරන්නේ? එහෙනම් වාහන ගෙන්නන්න! හරි? එතකොට වාහන ගෙන්නන්න ගෙන්නන්න මොකද වෙන්නේ? තෙල් බිල වැඩිවෙනවා. තෙල් බිල වැඩිවෙනකොට මොකද කරන්නේ? තෙල් මිල වැඩි කරනවා. ඔන්න ඕක තමයි මේ ආණ්ඩුවේ ක්‍රියාවලිය. වෙන කිසිම ආර්ථික ක්‍රියාවලියක් නැහැ.

ඊළඟට සංචිත වැඩි කරන්න කියලා සල්ලි අච්චු ගහනවා. මම ඉල්ලා සිටිනවා මහ බැංකු අධිපතිතුමාගෙන් අතන මෙතන යන්නේ නැතුව කෙළින් කියන්න, 2025 සහ 2026 රුපියල් බිලියන කීයක් අලුතෙන් අච්චු ගැහුවද ඩොලර් මිලදී ගැනීම සඳහා? මේ අයවැය පරතරය පියවන්න නෙවෙයි, ඩොලර් මිලදී ගැනීම සඳහා. එතකොට රුපියල් අච්චු ගහලා දානවා, දාලා ඩොලර් මිලදී ගන්නවා. එතකොට මොකද වෙන්නේ? වෙළඳපොළේ ඩොලර් සංචිත වැඩි කරගැනීම සඳහා රුපියල් පාරට ඇවිල්ලා උද්ධමනය ඇතිවෙනවා. උද්ධමනය ඇතිවෙනකොට මොකද කරන්නේ? 'මොකද කරන්නේ?' කියලා අහනවා නිලධාරීන්ගෙන්. 'සර්, අපි නංවමු පොලී අනුපාත' කියනවා. ඔන්න පොලී අනුපාත වැඩිවෙනවා. පොලී අනුපාත වැඩිවුණාම FD වලට හොඳ කාලයක් එනවා, නැවත බැංකුවලට සල්ලි එනවා.

ඊළඟට ආයෝජකයෝ එහෙමත් නැත්නම් ව්‍යාපාරිකයෝ ණය ගන්න ගියාම 18% යි වැට් (VAT) එක, SSCL එක 2.5යි, පොලිය 12යි, ඔය ටික ඔක්කොම එකතු වුණාම රුපියල් 100ක් ආයෝජනය කළාහම රුපියල් 35ක් ගෙවලා තමයි පටන් ගන්න වෙන්නේ. අයිස් වෙළඳාම, කසිප්පු වෙළඳාම හැරෙන්න වෙන කිසිම වෙළඳාමක් අපේ ආයෝජකයෙකුට කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ආර්ථිකය පල්ලහට යනවා.

ඉතින් ඔය වගේ කිසිම ආකාරයකට නැහැ. ඊළඟට ආයෝජන. බොහොම පැහැදිලිව මම කියනවා, කොටස් වෙළඳපොළෙන් විතරක් අනුර කුමාර දිසානායක යටතේ 2025දී රුපියල් බිලියන 37ක් ආපහු ගියා, පළවෙනි මාස හතරේදී රුපියල් බිලියන 27ක් කොටස් වෙළඳපොළෙන් විදේශ ආයෝජකයෝ අයින් කරගත්තා. එක රුපියලක්, එක ඩොලරයක් ගෙනල්ලා නැහැ. අද ලොකුවට මේ අධිවේගී පාරවල් හදන්න යනවා. මම කියනවා බොහොම පැහැදිලිව, කඩවත - මීරිගම අධිවේගී මාගර්ය සඳහා චීනයෙන් ඩොලර් මිලියන 500ක් ලැබුණායි කිව්වා, වැඩ පටන් ගත්තායි කිව්වා. එක ඩොලරයක් මේ 2026 මේ ජූනි පළවෙනිදා වෙනකොට එක ඩොලරයක් ආවා නම් ආර්.ඩී.ඒ. (RDA) එක පෙන්නන්න කියලා අපි කියනවා චීනයෙන්

කිසිම ආයෝජනයක් නැහැ, කිසිම ආකාරයක ක්‍රියාවලියක් නැහැ. 8% පොලියට විදේශවලින් ණය අරගෙන එදා වේල පිරිමහගෙන පල්ලමට යන ආර්ථිකයක් තමයි අපිට දකින්න ලැබෙන්නේ. ඉතින් ඒ නිසා මේ රටේ ජනතාවට අපි කියන්න ඕනේ, ගල්ෆ් යුද්ධය නිසා නෙවෙයි කිසිසේත්ම මේ ප්‍රශ්නය ඇතිවෙලා තියෙන්නේ. මීට වඩා අබර්ද තිබ්ච්ච කාලවල ලංකාවේ ඒ අබර්ද කළමනාකරණය කරගත්තා. මම පෙන්නුවා, අද වෙනකොට තෙල් මිල ශීඝ්‍රයෙන් පහළට යනවා නමුත් අපේ ආණ්ඩුව තෙල් මිල වැඩි කරගෙන යනවා, ඉදිරි කාලයේ තවත් වැඩි කරන්න නියමිතයි. ඒ වගේම නිකන් ලැබෙන සූයර් බලය, නිකන් ලැබෙන සුළං බලය, වැහි කාලෙට නිකන් ලැබෙන ජල විදුලිය කප්පාදු කර කර, කප්පාදු කර කර ගල්අඟුරු, තෙල් දහනය කරලා අපේ ජනතාවගේ විදුලි බිල වැඩි කරනවා, අපේ ජනතාවට බර පටවනවා, අපේ ජනතාවගේ ව්‍යාපාර කඩා වැටෙන තත්ත්වයකට පත් කරලා තියෙනවා.

ඒ නිසා මේ මෝඩකම්වලින්, මේ නොහැකියාවන්ගෙන්, මේ උද්ධච්චකම්වලින් රට තවත් ඉදිරියට ගෙනියන්න බැහැ. ඒ නිසා අපි බොහොම ආයාවනාත්මකව, විශේෂයෙන්ම මේ ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා කටයුතු කරපු උගත් මේ රටේ මධ්‍යම පාන්තික පිරිස්, වෘත්තීයවේදීන්, ආගමික නායකයන් සියලු දෙනාගෙන්ම ඉල්ලනවා, මේ රට නැවතත් පල්ලමට යමින් තියෙන්නේ, පරණ ජාවාරම්කාර වෙංර පන්තිය නැවත මේ රට තමන්ගේ අතට අරගෙන තියෙනවා, පරණ දූෂිත නිලධාරී රැල අද මේ රටේ පාලනය ගෙනියනවා. පක්ෂයක් උත්සාහ කරනවා තනි පක්ෂයක් මේ රටේ ගෙනිහිල්ලා සෙසු සියලු දෙනා හිරගෙවල්වලට ගාල් කරලා රටේ තනි පක්ෂ ක්‍රමයක් ඇති කරන්න, අන්න ඒ ක්‍රියාවලියට එරෙහිවයි අද මේ නොයෙක් දේශපාලන මතිමතාන්තර තිබුණත් මේ ජනතාවාදී ඒකාබද්ධ විපක්ෂය කටයුතු කරන්නේ. ඉදිරි කාලයේදී අපි තවදුරටත් මේ වංචනික ක්‍රියාවන් හෙළි කරනවා විතරක් නෙවෙයි, රටට ඇවැසි මඟ, රටට ඉදිරියට ගෙනියන්න පුළුවන් මඟ හෙළිදරව් කිරීමටත්, ඉදිරිපත් කිරීමටත් කටයුතු කරන බව කියන්න ඕනේ."

## හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න දැක්වූ අදහස්

"සුභ උදෑසනක් වේවා සියලුම මාධ්‍ය හිතවතුන්ට.

අද විශේෂයෙන්ම අපි ඒකාබද්ධ විපක්ෂය මඟින් මේ පවත්වන්නේ මේ පවතින රටේ ආර්ථිකය පිළිබඳව. අද මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමාත් අපේ හිටපු අමාත්‍ය චම්පික රණවක මැතිතුමාත් ඉතාමත් පැහැදිලිව අංශ දෙකක් ගැන කතා කරා.

එතකොට මේ රටේ ආර්ථිකය අද මහාචාර්ය ජී. එල්. පීරිස් කිව්වා මේ IMF එකේ දේවල් හින්දා තමයි මේක වුණේ කියලා, ඒක ඇත්ත. ඇයි ඒකට හේතුව? එදා ඒක හින්දා තමයි අපි සංසන්දනය කරන්න ඕනේ, එදා IMF එකත් එක්ක අපි කොහොමද වැඩ කරේ? කොහොමද අපි අපේ ජනතාව වෙනුවෙන් තීන්දු ගත්තේ? අද කොහොමද එවැනි තීන්දුවක් ගැනීමට හැකියාවක් නැත්තේ? මෙන්න මේක තමයි පැහැදිලිව ඇහුවේ.

ඒ නිසා අපි බලන්න ඕනේ, දැන් මේ එදා IMF එකත් එක්ක කතා කරලා රනිල් වික්‍රමසිංහට එදා මුහුණ දුන්න අබර්දය, අද මේ මැදපෙරදිග තියෙන අබර්දය නෙවෙයි, මතක තියාගන්න. මේ හෝමුස් එකක් වහලා තියෙන අබර්දයෙන් ඇතිවෙන මේ ඉන්ධන පිළිබඳ අබර්දයක් නෙවෙයි. මේ ලංකාවේ සියලුම අංශ

කඩාගෙන වැටිලා. මේ රටේ කන්න නැහැ, ඉන්ධන නැහැ, විදුලි බලය නැහැ. ඒ විතරක් නෙවෙයි මුදල් නැහැ, ආහාර නැහැ.

සකලවිධ අබර්ුදයකට තමයි රනිල් වික්‍රමසිංහ එදා මුහුණ පෑවේ. එවැනි අබර්ුදයක් අරගෙන අතට, අවුරුදු දෙකක් යනකොට සියලු ආර්ථික දර්ශක දියුණු කරන්න පුළුවන් වුණා නම්, ඒ දියුණු කරලා තියෙන දර්ශක මැදපෙරදිග යුද්ධයක් ආවා කියලා කොහොමද මේ එක කාරණාවක් නිසා කඩාගෙන වැටෙන්නේ?

එදා තිබුණේ ලංකාව විශාලා මහනුවර වගේ. මේ රටේ කිසි දෙයක් නැහැ. මිනිස්සු හිටියේ පෝලිම් කිලෝමීටර් හතර පහ පෝලිම්වල. වාහන තිබුණේ, මොටර් සයිකල් තිබුණේ, මිනිස්සු හිටියේ. එතකොට එවැනි අරාජික තත්ත්වයක් රටේ ඇතිවෙලා. භාණ්ඩාගාරයේ මුදල් ප්‍රමාණය, විදේශ මුදල් ඩොලර් මිලියන 20 ට කඩාගෙන වැටිලා. මුකුත් නැහැ, සල්ලිත් නැහැ. බඩු ගේන්න සල්ලිත් නැහැ. කන්න දෙන්න සල්ලිත් නැහැ, මොනවත් නැති රටේ කොහොමද එදා මේකට මුහුණ දුන්නේ?

එදා බලන්න ජනාධිපතිතුමා ගන්නකොට, රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ රටේ ආර්ථික වර්ධනය කීයද තිබුණේ? ආර්ථික වර්ධනය (ඍණ) -17.2 කට වැටිලා තිබුණා. ඒ කියන්නේ ආර්ථික වර්ධනයක් නෙවෙයි, ආර්ථිකය කඩාගෙන වැටෙනවා -17.2% ක වේගයකින්.

එතුමා අරගෙන 2024 වෙනකොට මේක (ඍණ) අගය (ධන) +5.3 ක ආර්ථික වර්ධන වේගයකින්, ඒ කියන්නේ ආර්ථිකය 22.5% කින් දියුණු කරා අවුරුදු දෙකක් ඇතුළත, මතක තියාගන්න. ඒක හින්දා තමයි ආචාර්ය ඩොනල්ඩ් ලූ කියන්නේ මේක ආශ්චර්යයක් ආර්ථිකයේ.

එතකොට අද කීයද? එහෙම ගත්ත රටේ මේ මැදපෙරදිග අබර්ුදයක් ආවා කියලා, එක තැනක තියෙන අබර්ුදය කීයද, දැන් 3% කට කඩාගෙන වැටිලා ආර්ථිකය. එතකොට ආර්ථිකය අඩු වෙනවා කියන්නේ මේ රටේ සංවර්ධනයක් නැහැ. මේ රටේ දියුණුවක් නැහැ. දියුණුව කඩාකප්පල් වෙලා.

අනිත් එක විදේශ සංචිත බලන්නකෝ. එදා 2022 තිබුණේ අබර්ුදය වෙලාවේ, මේ මහා අබර්ුදයක් රටේ තිබිලත් ඒ වෙලාවේ කීයද තිබුණේ? ඩොලර් මිලියන 20 යි අතේ තිබුණේ. එතකොට 2024 වෙනකොට එතුමා ඒක ඩොලර් මිලියන 6100 කට ගෙනාවා. බිලියන 6.1 කට එතුමා ගෙනාවා. 20 ගෙනාවා 6100 කට, අවුරුදු දෙකක් ඇතුළත.

අද කීයද තියෙන්නේ? අද දැන් මේ හම්බවුණු ඩොලර් මිලියන 700 ත් එක්ක ගත්තොත්, ඔක්කොම ගත්තාම ඩොලර් බිලියන හතහමාරක් එනවා. දැන් ගෙවන්න තියෙනවා ණය දැන් ආසන්නයේම ඩොලර් මිලියන 1300 ක්. ඒ කියන්නේ 1.3 ක් බිලියන. ඒකත් අඩු කළාම එතකොට වෙන්නේ කීයද? නැවත එනවා 6.2 කට. ඒ ආනයන නැතුව හොඳේ, කෑම ගේන්න මේවා නැතුව. ඒවාත් අඩු වුණාම තවත් අඩුයි. දැන් කීයද 6.2.

එතකොට 2025 වෙනකොට අපි තියෙන්න ඕනේ ඩොලර් බිලියන 8.5 ක් ලංකාවේ මේ 2028 ණය ගෙවන්න නම්. අපේ අතේ තියෙන්න ඕනේ ඩොලර් බිලියන 8.5 ක්. තිබුණද? අදත් නැහැ.

2026 වෙනකොට ඩොලර් බිලියන 10 පන්නලා තියන්න ඕනේ. අපි ණය ගෙවන්නේ නැත්නම්, නැත්නම් ආපහු බංකොලොත් වෙනවා රට. නමුත් ඒ 10 ක් තියෙන්න ඕනේ රටේ තියෙන්නේ 6.2 යි."

කෝ දැන් මේ, මේකට කියන්න පුළුවන්ද මැදපෙරදිග යුද්ධය? එහෙමනම් රනිල් වික්‍රමසිංහට තිබුණු යුද්ධය, බුදු අම්මේ යුද්ධයක් නෙමේ, මේ ලංකාවේ ඇතුළේ ලෝක යුද්ධය වගේ තිබුණේ.

එතකොට රාජ්‍ය ආදායම එතුමා 16% කින් වැඩි කරගත්තා. දැන් ඔය කියනවානේ රාජ්‍ය ආදායම වැඩිවුණා කියලා, ඒ රාජ්‍ය ආදායම වැඩි වෙනකොට බදු කීයද ගැහුවේ? කොච්චර සුළු බදු ප්‍රමාණයක් ගහලාද ඒ 6.1 ගැහුවේ? අද මොනතරම් බදුද? අද මේ වැට් බද්ද අඩු කරනවා කියලා ආපු මිනිස්සු 20% පන්නලා දැන් වැට් ගහනවා. මේ වගේ හැම එකටම බදු, වරායට බදු, මේ හැම එකටම බදු ගහලා දැන් අද 6% රාජ්‍ය ආදායම වැඩි කරගන්නවා කියලා කියන්නේ.

එතකොට අනිත් එක විරැකියාව. විරැකියාව 2022 එතුමා භාරගන්නකොට 7.2% ක් තිබුණේ ඒක. එතුමා 2024 වෙනකොට 3.2% ට අඩු කළා. මම මේ පෙන්වන්නේ ආර්ථික අබර්දයක් කොහොමද හසුරුවා ගන්නේ. අද මේගොල්ලන්ගේ නොහැකියාව මේ පෙන්වන්නේ. මේ මේගොල්ලෝ මහ ලොකු මැදපෙරදිග යුද්ධයක් ගැන, හෝමුස් එකක් ගැන කතා කරනවා. මම කතා කරන්නේ හෝමුස් එක ගැන නෙවෙයි, ලංකාවේ තිබුණු යුද්ධය ගැන."